සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

33 S I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය ..............................

# ගිණුම්කරණය I

කාලය පැය දෙකයි

උපදෙස්

- අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු දෙක බැගින් හිමි වේ.
- විභාග අංකය ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

| ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

01. පහත කුමන ප්‍රකාශනය ආයතනයක **ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
 1. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගනුදෙනු පොත්වල සටහන් කරයි.
 2. වාර්ෂික විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
 3. සැලසුම් කිරීම හා පාලනය කිරීම සඳහා කළමනාකරුවන්ට තොරතුරු සපයයි.
 4. ඇල්ම ඇති පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනය කරයි.
 5. අයිතිකරුවන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සපයයි. (.......)

02. මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග හඳුනා ගැනීම 2020.01.01 සිට වෙනසකට භාජනය වීම අදාළ වන ගිණුම්කරණ පරිසරය වන්නේ,
 1. ආර්ථික හා දේශපාලන පරිසරය 2. සමාජ හා සංස්කෘතික පරිසරය
 3. නෛතික පරිසරය 4. තාක්ෂණික පරිසරය
 5. වෘත්තිය හා ශිල්පීය පරිසරය (.......)

03. 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු ජනහිත ට්‍රේඩර්ස් හි පොත්වලින් උපුටා ගන්නා ලදී.

| | රු.000 |
|---|---|
| වර්ෂය තුළ මුළු වත්කම් වැඩිවීම | 250 |
| අමරත ප්‍රාග්ධන සම්පාදනය | 50 |
| ගැනිලි | 25 |
| කාලච්ඡේදයේ ලාභය | 125 |

ඉහත තොරතුරු මත පදනම්ව, වර්ෂය තුළ වැඩි වූ වගකීම වන්නේ,
 1. රු. 100,000 2. රු. 150,000 3. රු. 200,000
 4. රු. 350,000 5. රු. 375,000 (.......)

04. ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ පහත පියවර සිදුවන අනුපිළිවෙල නිවැරදිව දැක්වෙන්නෙ,
 A - හඳුනා ගැනීම හා මැනීම B - විශ්ලේෂණය කිරීම
 C - සාරාංශ කිරීම D - සටහන් කිරීම
 E - වර්ග කිරීම
 1. A,B,C,D හා E 2. A,B,D,C හා E 3. A,C,B,D හා E
 4. A,D,E,B හා C 5. A,D,E,C හා B (.......)

05. ආයතනයක 2019.03.31 දිනට මාසික බැංකු ප්‍රකාශනයෙහි රු. 325,000 ක අයිරා ශේෂයක් පෙන්නුම් කරයි. මෙදිනට බැංකුවේ තැන්පත් කළත් උපලබ්ධි නොවූ චෙක්පත් වටිනාකම රු. 75,000 ක් හා නිකුත් කළත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් වටිනාකම රු. 50,000 ක් විය. 2019.03.31 දිනට ආයතනයේ මුදල් ගිණුමට අනුව ශේෂය වන්නේ,

1. රු. 200,000 අයිරාවකි. 2. රු. 250,000 අයිරාවකි. 3. රු. 300,000 අයිරාවකි.
4. රු. 325,000 අයිරාවකි. 5. රු. 350,000 අයිරාවකි. (.......)

06. නුවන් ව්‍යාපාරයේ ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

1. 2020.01.02 රු. 30,000 ක බඩු තොගයක් රුවන්ට ණයට විකිණීම.
2. 2020.01.03 දින රුවන් සමාගමින් රු. 1,000,000 ක යන්ත්‍රයක් ව්‍යාපාර භාවිතයට ණයට ගැනීම
3. 2020.01.05 රු. 10,000 කට අනිල්ගෙන් මිලට ගත් තොග ආපසු යැවීම.

ඉහත ගනුදෙනුවලට අදාළ මූලාශ්‍ර ලේඛනය අනුපිළිවෙලින් දැක්වෙන්නේ,

1. ලදුපත, ජ'නල් වවුචරය හා හරපත 2. ලදුපත, ජ'නල් වවුචරය හා බැරපත
3 ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය හා හරපත 4. ඉන්වොයිසිය, ජ'නල් වවුචරය හා හරපත
5. ඉන්වොයිසිය, ගෙවීම් වවුචරය හා බැරපත (.......)

- **ප්‍රශ්න අංක 07 හා 8 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

VAT සඳහා ලියාපදිංචි සුනෙත් සමාගමේ සියළු තොග ගැනුම් හා විකුණුම් සඳහා 15% ක VAT අදාළ වේ. මාසයේ VAT රහිත ණයට ගැනුම් රු. 500,000 ක් ද අත්පිට විකුණුම් රු. 700,000 ක් ද විය. සියළු තොග විකුණා ඇති බව සලකන්න.

07. ඉහත ගනුදෙනුවල බලපෑම පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්නුම් කරනු ලබයිද?

| | **වත්කම් (රු.000)** | = | **වගකීම් (රු.000)** | + | **හිමිකම් (රු.000)** |
|---|---|---|---|---|---|
| 1. | + 700 | | + 500 | | + 200 |
| 2. | + 730 | | + 530 | | + 200 |
| 3. | + 775 | | + 575 | | + 200 |
| 4. | + 805 | | + 605 | | + 200 |
| 5. | + 880 | | + 680 | | + 200 |

(.......)

08. ඉහත තොගයට සුනෙත් සමාගම විසින් එකතු කරන ලද අගයට අදාළ බදු ප්‍රමාණය වන්නේ,

1. රු. 15,000 2. රු. 30,000 3. රු. 75,000
4. රු. 105,000 5. රු. 180,000 (.......)

09. මාසිකව රු. 2,000 ක් ව පැවති සුළු මුදල් අග්‍රිමය අප්‍රේල් සිට රු. 500 කින් වැඩිකර ඇත. මාර්තු ආරම්භක අත ඉතිරිය රු. 800 කි. මාර්තු හා අප්‍රේල් මාස දෙකේ සුළු වියදම් එකතුව රු. 4,000 කි. මාර්තු මාසයට වඩා අප්‍රේල් මාසයේ සුළු වියදම 50% වැඩි වී ඇත. අප්‍රේල් මස සඳහා ප්‍රතිපූරණය කළ මුදල වන්නේ,

1. රු. 500 2. රු. 1,300 3. රු. 1,600
4. රු. 2,100 5. රු. 2,400 (.......)

- **පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 10, 11, 12 ට පිළිතුරු සපයන්න.**

සඳරුවන්ගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු. 50,000 එදිනට ණයහිමි ලෙජර ශේෂ ලැයිස්තු එකතුවට එකඟ නොවුණි. එදිනට කෙටුම්පත් ශේෂ පිරික්සුමද සම නොවූයෙන් වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කරන ලදී. පසුව කරන ලද පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

- ලද වට්ටම් තීරුවේ එකතුව රු. 10,000 ණය හිමි පාලන ගිණුමේ වැරදි පැත්තේ සටහන් කර ඇත.
- රු. 15,000 ක ගැනුම් ඉන්වොයිසියක් අදාළ ණයහිමියාගේ ගිණුමේ සටහන් කර නැත.
- ණය හිමියකුට ගෙවූ රු. 25,000 ගෙවීම් ජ'නලයේ දෙවරක් සටහන් කර ඇත.

10. ඉහත වැරදි හේතුවෙන් ශේෂ පිරික්සුමේ විවෘත කළ අවිනිශ්චිත ගිණුමේ ශේෂය,

1. රු. 10,000 හර  2. රු. 10,000 බැර  3. රු. 20,000 හර
4. රු. 20,000 බැර  5. රු. 35,000 හර  (.......)

11. 2019.03.31 දිනට ණයහිමි පාලන ගිණුමේ සංශෝධිත ශේෂය වන්නේ,

1. රු. 15,000  2. රු. 55,000  3. රු. 45,000
4. රු. 65,000  5. රු. 95,000  (.......)

12. වැරදි නිවැරදි කිරීමට පෙර ණයහිමි ලෙජර ශේෂ ලැයිස්තු එකතුව,

1. රු. 15,000  2. රු. 25,000  3. රු. 45,000
4. රු. 50,000  5. රු. 55,000  (.......)

13. ව්‍යාපාරයක් විසින් අනුගමනය කරන ගිණුම්කරණ පිළිවෙත් හා සංකල්ප කිහිපයක් පහත දැක්වේ.

| **ගිණුම්කරණ පිළිවෙත** | | **සංකල්පය** |
|---|---|---|
| 1. කාර්ය සාධන බැඳීම් ඉටුකල පසු ආදායම් හඳුනා ගැනීම. | A | අඛණ්ඩ පැවැත්ම |
| 2. මූල්‍ය කල්බදු ක්‍රමයට ගත් ගොඩනැගිල්ලක් කල්බදු ගැනුම්කරුගේ පොත්වල වත්කමක් ලෙස සටහන් කිරීම. | B | විචක්ෂණ/ආරක්ෂණ |
| 3. වත්කම් ජංගම හා ජංගම නොවන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කිරීම | C | යථාරූපි |
| 4. වසර අග තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට හඳුනා ගැනීම | D | උපලබ්ධි |

1. A,B,D,C  2. A,C,B,D  3. B,D,C,A
4. D,C,A,B  5. D,C,B,A  (.......)

14. ව්‍යාපාරයක හිමිකරු මැදිහත්වීමකින් තොරව වත්කම් ඉහළ යාම හෝ වගකීම පහළ යාම හෝ නිසා හිමිකම වැඩිවීමක් තුළින් හඳුනාගත හැකි ගිණුම්කරණ මූලිකාංගය වන්නේ,

1. වත්කම්  2. වගකීම්  3. ආදායම්  4. වියදම්  5. හිමිකම්  (.......)

15. නිෂ්පාදන ව්‍යාපාරයක් පහත තොරතුරු ඔබට සපයයි.

| | (රු. 000) |
|---|---|
| ආරම්භක ද්‍රව්‍ය තොගය සමඟ වර්ෂය තුළ ගබඩාවට ලැබුණු තොගයේ පිරිවැය | 260 |
| තොග ලෙජරයට අනුව නිකුත් කළ තොගයේ පිරිවැය | 200 |
| වසර අග ඉතිරි තොගයේ ශුද්ධ උපලබ්ධි අගය | 50 |
| ඍජු ශ්‍රම පිරිවැය | 90 |
| වර්ෂය තුළ නොනිමි තොගවල වැඩිවීම | 23 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | 33 |
| නිෂ්පාදිත ගබඩා කිරීමේ පිරිවැය | 15 |

ඉහත තොරතුරු අනුව නිෂ්පාදන පිරිවැය හා කාලච්ඡේද පිරිවැය වන්නේ,

| | **නිෂ්පාදන පිරිවැය** (රු.000) | **කාලච්ඡේද පිරිවැය** (රු.000) |
|---|---|---|
| 1. | 300 | 10 |
| 2. | 300 | 25 |
| 3. | 323 | 25 |
| 4. | 346 | 10 |
| 5. | 346 | 25 |

(.......)

16. ක්‍රීඩා සංගමයක පහත තොරතුරු ඔබට ඉදිරිපත් කරයි.

- සංගමයේ සාමාජික සංඛ්‍යාව 100 ක් වන අතර වාර්ෂික සාමාජික මුදල රු. 1200 කි.
- වාර්ෂික සාමාජික මුදල් හිඟහිටි සාමාජික සංඛ්‍යාව වර්ෂය මුල 10 ක් හා වර්ෂය අග 5 ක් විය.
- අර්ධ වර්ෂයක් සඳහා සාමාජික මුදල් ඉදිරියට ගෙවූ සාමාජික සංඛ්‍යාව වර්ෂය මුල 15 ක් හා වර්ෂය අග 7කි.

ඉහත තොරතුරු අනුව වර්ෂය තුළ දී ලද සාමාජික මුදල කීයද?

1. රු. 113,400 කි. 2. රු. 118,800 කි. 3. රු. 119,400 කි.
4. රු. 120,600 කි 5. රු. 121,200 කි (.......)

17. නිසි පරිදි ගිණුම් පොත් පවත්වා නොගන්නා ව්‍යාපාරයක 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු අනාවරණය කරගෙන ඇත.

| | (රු. 000) |
|---|---|
| විකුණුම් | 300 |
| ගැනුම් | 240 |
| ආපසු යැවුම් | 10 |
| 2018.04.01 ට තොගය | ? |
| 2019.03.31 ට තොගය | 20 |

විකුණුම් මිලට 20% ක දළ ලාභ ආන්තිකයක් සහිතව විකුණුම් මිල තීරණය කිරීම ව්‍යාපාර ප්‍රතිපත්තියයි. ආරම්භක (2018.04.01 ට) තොගයේ වටිනාකම වන්නේ,

1. රු. 20,000 2. රු. 30,000 3. රු. 45,000
4. රු. 50,000 5. රු. 60,000 (.......)

- **පහත තොරතුරු ඇසුරින් අංක 18,19 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

අවන්ත, භවන්ත හා සිවන්ත පිළිවෙලින් 3:2:1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයෙන් 2018.04.01 දින සිවන්ත විශ්‍රාම ගත් අතර එදිනට තක්සේරු කළ කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුලින් ගැලපුම් කර ඇත. සිවන්තගේ මුළු හිමිකම රු. 200,000 වටිනාකම 10% ණය ගිණුමකට මාරු කරන ලදි.

2018.04.01 ට තිදෙනාගේ ජංගම ගිණුම් ශේෂ පිළිවෙලින් රු. 75,000 ක් 50,000 ක් හා 25,000 ක් වේ. එදිනට අවන්තගේ හා භවන්තගේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ එකතුව රු. 600,000 වන අතර 2019.03.31 ට එය රු. 575,000 ක් විය.

අවන්තගේ හා භවන්ත ව්‍යාපාරය තව දුරටත් පවත්වා ගෙන ගිය අතර නව හවුල් ගිවිසුම අනුව 3:2 අනුපාතයට ලාභාලාභ බෙදා ගැනීමටත් ආරම්භක ප්‍රාග්ධන ශේෂවලට 10% වාර්ෂික පොළියක් ගෙවීමට හා මාසිකව රු. 10,000 බැගින් වේතන ගෙවීමට එකඟ විය. වර්ෂයේ උපයන ලද ලාභය රු. 380,000 කි.

18. 2018.04.01 දිනට සිවන්තගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂය වන්නේ,

1. රු. 125,000 2. රු. 150,000 3. රු. 175,000
4. රු. 200,000 5. රු. 225,000 (.......)

19. 2019.03.31 අවන්ත හා භවන්තගේ ලාභ කොටස වන්නේ,

| | අවන්ත (රු.) | භවන්ත (රු.) |
|---|---|---|
| 1. | 36,000 | 24,000 |
| 2. | 48,000 | 32,000 |
| 3. | 72,000 | 42,000 |
| 4. | 168,000 | 112,000 |
| 5. | 180,000 | 120,000 |

(.......)

20. LKAS 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශන) ප්‍රමිතියට අනුව පහත දෑ අතරින් මුදල් යන්නට ඇතුළත් වන්නේ,

A - අතැති මුදල් B - ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය කර ඇති මුදල්
C - ඉල්ලුම් තැන්පතු මුදල D - මාස තුනට අඩු ස්ථාවර තැන්පතු මුදල
E - සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර ඇති මුදල

1. A පමණි. 2. A හා B පමණි. 3. A හා C පමණි.
4. A,B,C හා D පමණි. 5. A,B,C,D,E යන සියල්ලම (.......)

21. LKAS 08 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි) ප්‍රමිතියට අනුව පහත සඳහන් ඒවායින් ඇස්තමේන්තු වෙනස්වීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත **නොහැක්කේ**,

A - ඵලදායි ජීවකාලය හා සුන්බුන් අගය ඉහළ යාම
B - ප්‍රවර්තන වර්ෂයේ සිට හීනවන ක්‍රමයට ක්ෂය කිරීම
C - කාර්ය සාධන බැඳීම ඉටුකළ පසු ආදායම හඳුනා ගැනීම
D - විකුණුම් මත වගකීම් සහතික ප්‍රතිශතය ඉහළ දැමීම.

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. A හා C පමණි. 5. A,B හා D පමණි (.......)

22. උදාර මෝටර් සමාගම 2018.04.01 දින සේවා පැකේජයක් සමඟ අලවි කරන ලද මෝටර් වාහනයට අදාළ විකුණුම් ගිවිසුමේ කොන්දේසි හා වෙළඳපල අගයන් පහත දැක්වේ.

| කාර්යයන් | වෙළඳපල අගය (රු.000) |
|---|---|
| ආරම්භයේ රු. 2,700,000 ප්‍රතිෂ්ඨාවක් ගෙවීමෙන් පසු වාහනය ලබාදීම | 2,500 |
| විකුණා සතියක් තුල පළමු වර්ෂය සඳහා පූර්ණ ආවරණ රක්ෂණයක් ලබාදීම | 100 |
| විකුණා සතියක් තුළ වාහනය ලියා පදිංචිය කර දීම | 25 |
| සෑම මාස 6 කට 1 ක් වන පරිදි වාහනයට සේවා මුර 3 ක් දීම | 75 |

(SLF RS-15) ආදායම් හඳුනා ගැනීමේ ප්‍රමිතයට අනුව2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම හා එදිනට වගකීම වන්නේ,

| | **ආදායම් (රු.000)** | **වගකීම (රු.000)** |
|---|---|---|
| 1. | 2,500 | 25 |
| 2. | 2,500 | 50 |
| 3. | 2,550 | 25 |
| 4. | 2,650 | 50 |
| 5. | 2,675 | 25 |

(.......)

23. පහත ගණුදෙනු අතරින් සීමිත පොදු සමාගමක හිමිකම **අඩුවීමට** හේතුවන ගනුදෙනුව / ගනුදෙනු වන්නේ,

A - සමාගම මිලට ගෙන තිබූ කොටස් විකිණීම
B - හිමිකම් නිකුතුවක් කළ අතර, එය සියළු කොටස්කරුවන් මිලට ගෙන තිබීම.
C - සංචිත ප්‍රාග්ධනිත කිරීම
D - ඉඩම් ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් අලාභයක් ඇතිවීම.

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
4. D පමණි. 5. A හා D පමණි (.......)

- **අංක 24,25 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු සීමිත නයන පොදු සමාගමේ මෑත වර්ෂ දෙකේ අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී.

| | **2019.03.31 දිනට** (රු. 000) | **2018.03.31 දිනට** (රු. 000) |
|---|---|---|
| ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 7000 | 5000 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 300 | - |
| පොදු සංචිතය | 500 | 500 |
| රඳවාගත් ඉපැයුම් | 2100 | 1500 |

**අතිරේක තොරතුරු**

1. මෝටර් රථ ප්‍රත්‍යාගණනයෙන් රු. 500,000 ක අතිරික්තයක් ජනනය වී ඇත. මෙම වත්කම පෙර වර්ෂයේ ප්‍රත්‍යාගණනයේ දීරු. 200,000 අලාභයක් ලබා දී ඇත.
2. සාමාන්‍ය කොටස් සඳහා රු. 300,000 ක අතුරු ලාභාංශයක් ද ගෙවා ඇත.
3. රු. 500,000 ක හිමිකම් නිකුතුවක් හා රඳවාගත් ඉපැයුම් භාවිතා කර සංචිත ප්‍රාග්ධනිත කිරීමක් ද කර ඇත.
4. කාලච්ඡේදයේ ආදායම් බදු වියදම, බදු පෙර ලාභයෙන් 1/5 කි.

24. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ බදු පෙර ලාභය වන්නේ,

1. රු. 2,680,000 කි. 2. රු. 2,880,000 කි. 3. රු. 3,000,000 කි.
4. රු. 3,200,000 කි 5. රු. 3,300,000 කි (.......)

25. මුළු විස්තීරණ ආදායම හා වෙනත් විස්තීරණ ආදායම වන්නේ,

| | **මුළු විස්තීරණ ආදායම** (රු.'000) | **වෙනත් විස්තීරණ ආදායම** (රු.'000) |
|---|---|---|
| 1. | 2,400 | 200 |
| 2. | 2,600 | 200 |
| 3. | 2,700 | 200 |
| 4. | 2,700 | 300 |
| 5. | 3,300 | 500 |

(.......)

26. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සීමිත රුසිරු පොදු සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධ පහත තොරතුරු ඔබට ඉදිරිපත් කරයි.

| | (රු.000) |
|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් | 6,000 |
| පොලි වියදම ( උපචිත පොලිය රු. 400,000) | 600 |
| ආදායම් බදු වියදම (උපචිත ආදායම් බදු රු. 200,000) | 1,600 |
| ක්ෂය | 1,200 |
| තොග වැඩිවීම | 500 |
| වෙළඳ ගෙවිය යුතු දෑ වැඩිවීම | 1,000 |

ඉහත තොරතුරු අනුව 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමේ බදු පෙර ලාභය වන්නේ,

1. රු. 4,900,000 2. රු. 5,300,000 3. රු. 5,900,000
4. රු. 6,400,000 5. රු. 6,500,000 (.......)

27. පහත සඳහන් කුමන අනුපාත අනුපිළිවෙලින් ආයතනයක **ද්‍රවශීලතාව** හා දිගුකාලීන **මූල්‍ය ස්ථාවරත්වය** මනිනු ලබයි ද?
1. ණයගැති පිරිවැටුම් අනුපාතය, ක්ෂණික අනුපාතය
2. ජංගම අනුපාතය, ණය - හිමිකම් අනුපාතය
3. ණය අනුපාතය, පොලී ආවරණ අනුපාතය
4. ජංගම අනුපාතය, මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය
5. ණය අනුපාතය, ජංගම අනුපාතය (.......)

28. පහත දැක්වෙන ගණුදෙනු අතරින් දැනට පවතින ජංගම අනුපාතය ඉහළ යාමට හේතුවන ගනුදෙනුව / ගනුදෙනු කාණ්ඩය වන්නේ,

A - ණයහිමියකු පියවීම

B - ලාභ ඇතිව අත්පිට විකිණීම

C - ණයට තොග මිලට ගැනීම

1. A පමණි 2. B පමණි 3. C පමණි 4. A හා B පමණි 5. A,B හා C යන සියල්ලම (.......)

29. ආයතනයක් භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයක සතියකට අදාළව පහත තොරතුරු ඉදිරිපත් කරයි.
**සෑම ඉරිදා** දිනයක්ම ආයතන නිවාඩු දිනයකි.

| | **උපරිම** | **අවම** |
|---|---|---|
| පාරිභෝජනය ඒකක (දිනකට) | 300 | 100 |
| පොරොත්තු කාලය (සති) | 6 | 2 |

මෙම අමුද්‍රව්‍යයේ අවම තොග මට්ටම කොපමණද?
1. ඒකක 1000 2. ඒකක 1600 3. ඒකක 1200 4. ඒකක 6000 5. ඒකක 9600 (.......)

30. සමාගමක් 2019.03.31 දිනට තොග අයිතම තුනක් සඳහා පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරයි.

| **අයිතම** | **නිෂ්පාදන පිරිවැය (රු.)** | **ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය (රු.)** | **ඇස්තමේන්තු කළ විකුණුම් වියදම (රු.)** |
|---|---|---|---|
| A | 10,000 | 13,000 | 1,000 |
| B | 11,000 | 12,000 | 2,000 |
| C | 12,000 | 6,000 | 6,000 |

**අයිතම ක්‍රමය** අනුව 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු තොගයේ වටිනාකම වන්නේ,
1. රු. 20,000 2. රු. 27,000 3. රු. 31,000
4. රු. 32,000 5. රු. 33,000 (.......)

........... x 40 = $\frac{\dots\dots}{120}$

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

31. පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය ද අසත්‍ය ද** යන්න සඳහන් කරන්න.

| | | **සත්‍ය / අසත්‍ය** |
|---|---|---|
| A | ගිණුම්කරණ අනුපාත මත ආයතනයක ලාභදායිත්වය විශ්ලේෂණය කිරීම මූල්‍ය ගිණුම්කරණයේ කාර්ය භාරයකි. | ................................................ |
| B | ව්‍යාපාරයක අතීත මෙන්ම අනාගත තොරතුරු භාවිත කිරීම කළමනාකරණ ගිණුම්කරණයේ සිදුකරයි. | ................................................ |
| C | ආයතනයක මුදලින් මැනිය හැකි ගනුදෙනු පමණක් ගිණුම්පොත්වල සටහන් කරයි. | ................................................ |
| D | ගිණුකම්රණ ප්‍රමිත වලට අනුකූලව පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි. | ................................................ |

32. ව්‍යාපාරයක පහත ගනුදෙනු නිසා එහි හිමිකම **වැඩි වේ**, **අඩුවේ** සහ **වෙනස් නොවේද** යන්න සඳහන් කරන්න.

**වැඩිවේ/අඩුවේ/වෙනස්නොවේ**

| | | |
|---|---|---|
| A | රු. 5000 ක පොළිය සහිත රු. 40000 ක බැංකු ණය වාරිකය ගෙවීම. | ................................................ |
| B | ව්‍යාපාරයේ රු. 25000 ක ප්‍රචාරණ වියදම අයිතිකරු විසින් පුද්ගලිකව ගෙවා දැමීම. | ................................................ |
| C | ණය හිමියෙකුගේ ශේෂය පියවීමේ දී රු. 1000 ක වට්ටමක් ලැබීම. | ................................................ |
| D | රු. 5000 ක තොගයක් පුන්‍ය ආයතනයකට පරිත්‍යාග කිරීම | ................................................ |

33. තනි පුද්ගල ව්‍යාපාරයකට අදාළව පහත ප්‍රකාශ සත්‍ය ද (T), අසත්‍ය ද (F) යන්න සඳහන් කරන්න.

**සත්‍ය / අසත්‍ය**

| | | |
|---|---|---|
| A | ගැනිලි ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා නොගනී. | ................................................ |
| B | යොදන ලද ප්‍රාග්ධනය හා රඳවාගත් ඉපැයුම් වල එකතුව හිමිකමට සමාන වේ. | ................................................ |
| C | ආදායම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගැලපුම් සංකල්පය යොදා ගැනේ. | ................................................ |
| D | ශුද්ධ වත්කම් ප්‍රවේශයෙන් ලාභය සෙවීමේදී ගැනිලි අඩු කළ යුතුය. | ................................................ |

34. පහත තොරතුරු තනි පුද්ගල ව්‍යාපාරයක් වන සුබෝධ ව්‍යාපාරයේ 2018.03.31 දිනට හා 2019.03.31 දිනට පැවති වත්කම් හා වගකීම් පහත වේ.

| | **2019.03.31 දිනට (රු.'000)** | **2018.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | 5200 | 4000 |
| ජංගම වත්කම් | 400 | 250 |
| මුළු වගකීම් | 3700 | 2300 |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුලදී අයිතිකරු ව්‍යාපාරයෙන් රු.150,000ක් ගැනිලි ලෙස ලබාගෙන ඇති අතර, රු. 60,000 ක් අතිරේක ප්‍රාග්ධනයක් ආයෝජනය කර ඇත. පහත සඳහන් දෑ ගණනය කරන්න.

අ) 2019.03.31 දිනට හිමිකම : රු. ....................................................

ආ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය / පාඩුවඃ රු. ..........................................

35. ආයතනයක් විසින් වත්කම් සම්බන්ධයෙන් ගිණුම් තැබීමේදී ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් බැහැරව ක්‍රියා කළ හැකි අවස්ථා දෙකක් සඳහන් කරන්න.

....................................................................................................................................................................

36. පහත දී ඇත්තේ ණයගැති පාලන ගිණුමෙන් උපුටා ගන්නා ලද අයිතම් වේ. ඒවා ලබාගෙන ඇති මූලාශ්‍රය නම් කරන්න.

**ලබාගෙන ඇති මූලාශ්‍රය**

| | | |
|---|---|---|
| A | විකුණුම් | ................................................ |
| B | ආපසු එවුම් | ................................................ |
| C | බොල් ණය | ................................................ |
| D | මුදල් ලැබීම් | ................................................ |

37. 2019.03.31 දිනට ව්‍යාපාරයක ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදි. පසුව කරන ලද විමර්ශනයේදී පහත වැරදි අනාවරණය විය.

A - 2019 මාර්තු මාසයේ දුරකථන මිල සඳහා නිකුත් කළ රු. 6500 ක චෙක්පත අගරු වී ඇති බව දැනුම් දී තිබුණ ද ගිණුම්ගත කර නොතිබීම.

B - ලැබීම් ජ'නලයේ වට්ටම් තීරුවේ එකතුව වූ රු. 4000, ණය හිමි පාලන ගිණුමට හර කර තිබීම.

ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් ලියන්න. (සංලක්ෂය අවශ්‍ය නොවේ.)

| වැරැද්ද | විස්තරය | හර | බැර |
|---|---|---|---|
| A | | | |
| B | | | |

38. රුමේෂ් ව්‍යාපාරය 2016.04.01 දින රු. 1,200,000 ට යන්ත්‍රයක් මිල දී ගෙන ඇති අතර එම යන්ත්‍රයේ ඵලදායි ජීව කාලය වසර 10 ක් බවත්, සුන්බුන් අගය රු. 200,000 ක් බවටත් ඇස්තමේන්තු කර ඇත. 2018.04.01 දින රු. 400,000 ක් වැයකර එම යන්ත්‍රය නවීකරණය කරන ලදී. මේ හේතුවෙන් යන්ත්‍රයේ සුන්බුන් අගය රු. 100,000 කින් වැඩි වන බවත්, ඵලදායී ජීව කාලය තවත් වසර 3 කින් වැඩි වන බවත් ඇස්තමේන්තු කරන ලදී. 2019.03.31 න් අවසන් වර්ෂයේ යන්ත්‍රයේ ක්ෂය ප්‍රමාණය කොපමණ ද?

.................................................................................................................................................................

- **ප්‍රශ්න අංක 39 හා 40 ට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.**

2018.04.01 දින අමල් හා බිමල් පිළිවෙළින් රු. 600,000 න් හා රු.400,000 න් ආයෝජනය කරමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යන ලදී. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව පහත තොරතුරු සපයා ඇත.

- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% ක වාර්ෂික පොලියක් හිමි වී ඇත.
- අමල් හා බිමල්ට පිළිවෙලින් රු. 100,000 හා රු. 60000 බැගින් වාර්ෂික වේතන හිමි වී ඇත.
- අමල් හා බිමල්ට පිළිවෙලින් රු. 60000 ක් හා රු. 40000 ක අවසාන ලාභ කොටස් ලෙස හිමි වී ඇත.
- 2019.03.30 දින ඉදිරි වර්ෂයේ විකුණුම් සඳහා චෙක්පතකින් ලද අත්තිකාරම් මුදල් වූ රු. 50000, අමල් තම පුද්ගලික ප්‍රයෝජනයට රැගෙන ගොස් තිබුණ ද ගිණුම්ගත කර නොතිබුණි.
- අමල් විසින් 2018.04.01 දින ව්‍යාපාරයට රු. 400,000 ක ණය මුදලක් සපයා තිබූ අතර ඒ සඳහා ගිවිසගත් පොලියක් නොමැති බැවින්, පොලිය ගිණුම්ගත කර නොමැත.

39. 2019.03.31 දිනෙන් අවසන් වසර තුළ හවුල් ව්‍යාපාරය උපයා ඇති නිවැරදි ශුද්ධ ලාභය කොපමණද?
රු. .........................................................

40. 2019.03.31 දිනට අමල් හා බිමල්ගේ ජංගම ගිණුම් ශේෂයන්,
අමල් රු. ......................................................... බිමල් රු. .........................................................

41. LKAS-37 (ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් හා අසම්භව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව ප්‍රතිපාදන හා අසම්භව්‍ය වගකීම් අතර වෙනස්කම් 2 න් දක්වන්න.

| **ප්‍රතිපාදන** | **අසම්භව්‍ය වගකීම්** |
|---|---|
| 1. ......................................................... | 1. ......................................................... |
| 2. ......................................................... | 2. ......................................................... |

42. සීමිත පොදු සමාගමක ගිණුම් කාලච්ඡේදය 2019.03.31 දිනෙන් අවසන් වන අතර,මූල්‍ය ප්‍රකාශන අනුමත කර ඇති දින 2019.06.30 වේ. එම දින දෙක අතර තුර සිදු වූ පහත සිදුවීම් '✓' ලකුණ යොදමින් ගලපන සිදුවීම් හා නොගලපන සිදුවීම් ලෙස වර්නා කර දක්වන්න.

| | | ගලපන සිදුවීම් | නොගලපන සිදුවීම් |
|---|---|---|---|
| A | රු. 1,000,000 ක අලාභයක් ඇති කරමින් 2019.03.31 දිනට පැවති මෝටර් රථයක් ගින්නකින් විනාශ වීම. | ...................... | ...................... |
| B | සාමාන්‍ය කොටස් හිමියන් සඳහා රු. 500,000 අවසන් ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම. | ...................... | ...................... |
| C | සේවකයෙකු විසින් 2019.03.20 දින ගොනුකළ නඩුවක් සම්බන්ධයෙන් වන්දි ලෙස රු. 250,000 ක් සමාගම විසින් ගෙවිය යුතු බව අධිකරණ තීන්දුවක් ලැබීම. | ...................... | ...................... |
| D | කාලච්ඡේදයේ අවසන් දිනට වූ රු. 20000 ක ණයගැතියකු බුන්වත් වීම. | ...................... | ...................... |

43. සංචිත ප්‍රාග්ධනීන කිරීම හා හිමිකම් නිකුතුව අතර සමානකමක් හා වෙනස්කමක් සඳහන් කරන්න.

සමානකම : ..........................................................................................................................................

අසමානකමක් : ......................................................................................................................................

- **ප්‍රශ්න අංක 44 සහ 45 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සීමිත විලී පොදු සමාගමේ 2018.04.01 දිනට පැවති හිමිකම් පහත දැක්වේ.

| | (රු.'000) |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 100000) | 10,000 |
| පොදු සංචිතය | 500 |
| රඳවාගත් ඉපැයුම් | 1500 |

**අතිරේක තොරතුරු**

1) 2018.10.01 දින එදිනට සිටින සෑම සාමාන්‍ය කොටස් දහයකටම එක බැගින් කොටසක් රු. 80 ක ප්‍රතිෂ්ඨාවක් යටතේ රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීන කරන ලදී.
2) 2019.01.01 දින කොටසක් රු. 100 ක ප්‍රතිෂ්ඨාවක් යටතේ සාමාන්‍ය කොටස් 10000 ක ප්‍රසිද්ධ කොටස් නිකුතුවක් කරන ලද අතර, අයදුම් පත්‍ර සමඟ මුදල් ලැබීමේ අවසන් දිනය වන විට කොටස් 15000 ක් සඳහා මුදල් ලැබුණි. සමාගම 3:2 අනුපාතයට විභාජනය කරමින් වැඩිපුර ලද අයදුම්පත් සමඟ මුදල් ප්‍රතික්ෂප කර යවන ලදී.

44. ඉහත ප්‍රසිද්ධ කොටස් නිකුතුවට අදාල පහත ජ'නල් සටහන් ලියන්න.

අ) අයදුම් පත්‍ර සමඟ මුදල් ලැබීම.

..........................................................................................................................................

..........................................................................................................................................

ආ) කොටස් විභාජනය කිරීම.

..........................................................................................................................................

..........................................................................................................................................

45. ඉහත කොටස් නිකුත් කිරීමෙන් හිමිකමේ සිදු වූ වැඩිවීම කොපමණද? රු. .......................................................

46. පහත එක් එක් ගනුදෙනුව අයත් වන්නේ මෙහෙයුම්, ආයෝජන මූල්‍ය කටයුතුවලට ද යන්න සඳහන් කරන්න.

| | | මෙහෙයුම්/ආයෝජන/මූල්‍ය |
|---|---|---|
| A | රු. 150,000 ක ණයහිමි ශේෂයක් පියවීම | ............................................ |
| B | රු. 200,000 ක ලාභාංශයක් සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවීම | ............................................ |
| C | රු. 50,000 ක ලාභාංශ ආදායමක් ලැබීම. | ............................................ |
| D | වර්ෂය තුළ රු. 40,000 ක් ආදායම් බදු ලෙස ගෙවීම. | ............................................ |

47. සීමිත පොදු සමාගමක 2019.03.31 දිනෙන් අවසන් වසර තුළ පහත ගනුදෙනු සිදුවී ඇත.

| | (රු '000) |
|---|---|
| වර්ෂයේ ආදායම් බදු වියදම | 240 |
| ගෙවූ අතුරු ලාභාංශ | 300 |
| රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනීන කිරීම | 500 |
| පොදු සංචිතයට මාරු කිරීම් | 200 |
| ප්‍රථම වරට ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | 240 |

2018.03.31 දිනට හා 2019.03.31 දිනට රඳවාගත් ඉපැයුම් ගිණුමේ ශේෂ පිළිවෙලින් රු. 800,000ක් හා රු. 1060000 ක් විය.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම කොපමණ ද? රු. ....................................

48. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂයේ සමාගමක විකුණුම් රු. 12,000,000 ක් වූ අතර එයින් 60% ක් ණයට විකුණුම් වේ. සමාගම භාණ්ඩ අලෙවිකරනුයේ පිරිවැයට 25% ක ලාභයන් ලැබෙන පරිදිය. පහත තොරතුරු ද සමාගමට අදාල වේ.

| | 2019.03.31 දිනට (රු.'000) | 2018.03.31 දිනට (රු.'000) |
|---|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | 800 | 400 |
| තොගය | 450 | 350 |

2019.03.31 දිනට පහත දෑ ගණනය කරන්න.

අ) තොග පිරිවැටුම් අනුපාතය .......................................

ආ) ණයගැති පිරිවැටුම් අනුපාතය .......................................

49. ආර්ථික ඇනවුම් ප්‍රමාණය ගණනය කිරීමේදී පදනම් කර ගන්නා උපකල්පන 4 ක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................
3. ..........................................................................................................................................
4. ..........................................................................................................................................

50. නිෂ්පාදන සමාගම පහත තොරතුරු අමුද්‍රව්‍ය අයිතමයක් හා බැඳේ.

ඇනවුම් පිරිවැය ඇනවුමක් සඳහා රු. 750

රඳවා ගැනීමේ පිරිවැය ඒකකයක් සඳහා වර්ෂයකට රු. 10

මාසික ඉල්ලුම ඒකක 5000

පහත දෑ ගණනය කරන්න.

අ) ආර්ථික ඇනවුම් ප්‍රමාණය (EOQ) : ........................................................................................

ආ) වාර්ෂික ඇනවුම් පිරිවැය: රු. ........................................................................................

❋❋❋